(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(17).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2023 ජූනි 23 සිකුරාදා

**2023 ජූලි 04 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

---

**2023 ජූලි 18 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

837/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, මධ්‍යම රජයට සහ පළාත් සභාවට අයත් පාසල් අතරින් ගුරු හිඟය පවතින, පානීය ජල පහසුකම්, වැසිකිළි පහසුකම්, විද්‍යාගාර, පුස්තකාල සහ ක්‍රීඩා පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් පාසලේ නම සහ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

850/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අපනයනය කරනු ලබන භාණ්ඩ සඳහා ශ්‍රී ලංකාවට ලැබිය යුතු විදේශ විනිමයෙන් සැළකිය යුතු කොටසක් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය නොකර විදේශයන්හි රඳවා තබා ගනු ලබන බව දන්නේද;

(ii) එසේ රඳවා තබා ගනු ලබන විදේශ විනිමය ප්‍රමාණය හඳුනාගැනීම සඳහා පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අභ්‍යන්තර විදේශ විනිමය වංචා වැළැක්වීම, ඒවා අනාවරණය කර ගැනීම සහ ඊට අදාළ වැරදිකරුවන්ට එරෙහිව පියවර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ පවතින නීති කවරේද;

(ii) ඉහත සඳහන් ආකාරයේ විනිමය වංචා වැළැක්වීම සඳහා විදේශ විනිමය පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

859/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොවිඩ්-19 හේතුවෙන් මිය ගිය පුද්ගලයන්ගේ මරණ ආදාහනය කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිමය තීරණය ගැනීමේදී "ප්‍රවීණයින්ගේ කමිටුවක්" විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය නොමඟ යැවීමකට ලක්කර ඇති බවට 2022/11/29 දින දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විසින් සිදු කරන ලද ප්‍රකාශය සමඟ එතුමා එකඟ වන්නේද;

(ii) ඉහත සඳහන් කරන ලද කමිටුව රජය මඟින් පත්කරන ලද කමිටුවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කමිටුව රජය මඟින් පත් කරන ලද කමිටුවක් නම් —

(i) එමඟින් කොවිඩ්-19 මරණවල අවසන් කටයුතු සිදු කරන ආකාරය පිළිබඳව විශේෂයෙන් සිදුකරන ලද නිර්දේශ;

(ii) පත්කිරීම් බලධාරියා;

(iii) යොමු කිරීමේ අනුදේශ සහ/හෝ අධිකාරි බලය;

(iv) සාමාජිකයන්ගේ නම් සහ තනතුරු;

(v) සභාපතිවරයාගේ නම;

(vi) එය අඛණ්ඩව රැස් වන්නේද;

(vii) නොඑසේ නම්, එය අවසන් වරට රැස්වූ දිනය;

(viii) මේ දක්වා පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව;

(ix) රැස්වීම් පවත්වනු ලබන ස්ථානය;

(x) එකී එක් එක් රැස්වීමේ මූලාසනය දරන ලද තැනැත්තන්ගේ නම් වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

871/2023

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර, කලුවිල, සේන විදුහල නමින් විදුහලක් තිබෙන බව දන්නේද;

(ii) එම විදුහලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව සහ සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "ජාතික පාසල් දහසේ ව්‍යාපෘතිය" සඳහා ඉහත පාසල තෝරා ගෙන තිබේද;

(ii) එම තීරණයෙහි වෙනසක් සිදු කර තිබේද;

(iii) ඉහත පාසල, ජාතික පාසලක් ලෙස දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1305/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ''සිසු සැරිය'' වැඩසටහන යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මේ වනවිට ධාවනය වන බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් බස්රථය ධාවනය වන ගමන් මාර්ගය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ''සිසු සැරිය'' වැඩසටහන තවදුරටත් පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරා ව්‍යාප්ත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1319/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2016 සිට 2020 දක්වා එක් එක් වර්ෂයේ පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) —

(i) විභාගය සඳහා පෙනී සිටි සිසුන් සංඛ්‍යාව;

(ii) විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා ගත වූ කාලය;

(iii) ප්‍රතිඵල නැවත සමීක්ෂණය කර ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා ගත වූ කාලය;

(iv) විභාගය සමත් වූ සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට ලබා දෙන ලද කාලය;

(v) එම සිසුන් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගැනීමට ගත වූ කාලය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1324/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පාසලක එක් පංතියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව සම්බන්ධයෙන් වර්ෂ 2015 සිට මේ දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් චක්‍රලේඛය නිකුත් කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් චක්‍රලේඛය මඟින් නියම කර ඇති රජයේ පාසලක එක් පංතියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45 දක්වා වැඩිකිරීමේ තීරණයක් මෑතකදී ගෙන තිබේ නම්, ඒ සඳහා බලපාන ලද හේතු කවරේද;

(ii) අධ්‍යාපන වෘත්තීය සමිති එම තීරණයට දැඩි විරෝධය දක්වා තිබීම හේතුවෙන්, එම තීරණය නැවත සමාලෝචනය කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1329/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති ගම්මාන අතරින් පානීය ජල ගැටලුව පවතින ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ගම්මානවල පවතින පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1715/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008.11.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට හා රජයේ ආයතන සඳහා දීමනා ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2009.05.26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි කාර්ය මණ්ඩලයට වරින්වර දීමනා ගෙවා තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iii) වර්ෂ 2020 සිට මේ දක්වා ගෙවා ඇති දීමනා මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2880/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ ආනයනය කරන ලද බිත්තර ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා සහ බිත්තර මිල සාධාරණ මට්ටමක පවත්වා ගැනීම සඳහා ගනු ලබන පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූලි 19 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1462/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුරාබදු දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සුරාබදු දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන එම දෙපාර්තමේන්තුවට අයත් සේවකයන් සංඛ්‍යාව සහ ඒකාබද්ධ සේවයට අයත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුරාබදු දෙපාර්තමේන්තුවට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරින්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරින්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒකාබද්ධ සේවයට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරින්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරින්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1507/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලේ සාමාජිකයන්ගේ දරුවන්ට එම අරමුදල මගින් ලබා දෙනු ලබන ශිෂ්‍යත්ව කවරේද;

(ii) එම ශිෂ්‍යත්ව ලැබීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ශිෂ්‍යත්ව ලැබූ දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ශිෂ්‍යත්ව ලබා දීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1545/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති ළමා නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) බාලිකා ළමා නිවාස සංඛ්‍යාව සහ පිරිමි ළමා නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම මධ්‍යස්ථානවල රැකවරණය ලබන ළමයින් සංඛ්‍යාව කොපමණද;

(iv) වෙනත් භාරයන් හා පෞද්ගලික අංශය විසින් පවත්වාගෙන යනු ලබන ළමා නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1580/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වේවැල් හා පන් ආශ්‍රිත කර්මාන්තකරුවන් අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටලුවකට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) වේවැල් හා පන් වගා කිරීම සඳහා දීර්ඝ කාලීන බදු පදනම යටතේ ඉඩම් ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

(v) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1619/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජල දූෂණය පිටුදැකීමේ අරමුණින් පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ගංගා 150ක් සංරක්ෂණය කිරීමේ "සුරකිමු ගංගා" ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගනු ලබන මූලාශ්‍ර කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා මේ වනවිට වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "සුරකිමු ගංගා" ව්‍යාපෘතිය යටතේ මේ වනවිට සංරක්ෂණය කර ඇති ගංගා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගංගා සංඛ්‍යාව සැළකීමේදී, ඉහත ව්‍යාපෘතියේ කාර්ය සාධනය අවම මට්ටමක පවතින බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1638/2022

ගරු මිලාන් ජයතිලක මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රිදියගම, සෆාරි උද්‍යානයේ සිදු කරනු ලබන සංවර්ධන කටයුතු කවරේද;

(ii) එම සංවර්ධන කටයුතු අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

(iii) මෙම උද්‍යානයේ සිටින දේශීය හා විදේශීය සතුන් නිසි පිරිදි අධීක්ෂණය කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2018 සිට මේ දක්වා එම උද්‍යානය නැරඹීමට පැමිණි දේශීය හා විදේශීය සංචාරකයන් සංඛ්‍යාව;

(ii) ඉහත කාලය තුළදී එම උද්‍යානයේ ආදායම;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1677/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිරුමුරිකණ්ඩි ගම්මානයේ ජනතාව විසින් භාවිතා කරන ලද අක්කර 10ක පමණ විශාලත්වයකින් යුතු ඉඩම යුද සමයට පෙර අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඉහත ගම්මානයේ ජනතාවට බෙදාදීම සඳහා කටයුතු කරන ලද අවස්ථාවේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඊට බාධා කරන ලද බවත්;

(ii) එම ඉඩමේ මේ වනවිට නිවාස, නිවාස අත්තිවාරම්, ළිං, වැසිකිළි, ක්‍රීඩාපිටි ආදිය පවතින බවත්;

(iii) එම ඉඩම ජනතාවට බෙදා දීම සඳහා අනුමතිය ඉල්ලා ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත්කර තිබුණද මේ දක්වා ඒ සඳහා අනුමතිය ලැබී නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ඉඩම ජනතාවට බෙදා දීම සඳහා පියවර ගන්නේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1757/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මන්දපෝෂණයෙන් පෙළෙන පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මන්දපෝෂණය පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1800/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති විවිධ සේවා සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ ඇති සමූපකාර ප්‍රාදේශීය වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රාදේශීය වෙළෙඳසැල්වල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වෙළෙඳසැල් සඳහා අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් සපයනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1811/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ''එක්ස්ප්‍රස් පර්ල්'' නෞකාවේ අනතුර හේතුවෙන් විශාල පරිසර හානියක් සිදු වූ බව පිළිගන්නේද;

(ii) එම පරිසර හානිය ගණනය කිරීමේ හා ඒ සම්බන්ධයෙන් වන්දි ලබා දීමේ ක්‍රියාවලියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූලි 20 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2530/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කින්නියා, මුතූර්, වෙරුගල්, තඹලගමුව සහ කුච්චවේලි යන එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජයේ ඉඩම්වල පදිංචිව සිටින ඉඩම් හිමිකම් ඔප්පු නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජයේ ඉඩම්වල පදිංචිව සිටින, හිමිකම් ඔප්පු ලබා දී ඇති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් පවුල් සඳහා ඔප්පු ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2576/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෘහාශ්‍රිත සහ වගාවන්ට හානිකරනු ලබන මීයන් වඳ කිරීම සඳහා රසායනික විෂ ද්‍රව්‍ය භාවිතා කරනු ලබන බව දන්නේද;

(ii) එම රසායනික විෂ ද්‍රව්‍යවල සංයුතිය තීරණය කරනු ලබන ආයතනය කවරේද;

(iii) රසායනික විෂ ද්‍රව්‍ය ශරීර ගතවීම හේතුවෙන් ජීවිතක්ෂයට පත් වන මීයන් අනුභව කිරීමෙන් ශ්‍රී ලංකාවට ආවේණික සතුන්ද ජීවිතක්ෂයට පත් වන බව දන්නේද;

(iv) එසේ නම්, මී උවදුර මර්දනය කිරීම සඳහා ජීව විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගමනය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2621/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපොළවල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිවයුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදුවිය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2692/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුර ගමන් සේවාවල යෙදෙන සුඛෝපභෝගී බස්රථවලින් අය කරනු ලබන වාර්ෂික බදු මුදල කොපමණද;

(ii) මාර්ග බලපත්‍ර සඳහා එම බස්රථවලින් අය කරනු ලබන මුදල කොපමණද;

(iii) ඉන්ධන, ටයර් සහ වාහන අමතර කොටස් මිල අධික ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවකදී ඉහත ගාස්තු අය කිරීම සාධාරණ වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ බස් කර්මාන්තය සඳහා ලබා දිය හැකි සහන කවරේද;

(ii) මගී ජනතාවට ප්‍රශස්ත ප්‍රවාහන සේවාවක් ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2844/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂි උපකරණ හා මෙවලම්වල විවෘත වෙළෙඳපොළ මිල අධික ලෙස ඉහළ ගොස් ඇති බවත්;

(ii) කෘෂිකර්ම කටයුතු සඳහා උපකරණ මිලදී ගැනීමට නොහැකිව ගොවීන් දැඩි දුෂ්කරතාවයකට මුහුණ දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කෘෂි උපකරණ හා මෙවලම් සහන මිලට ලබාදීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2878/2023

ගරු යදාමිණී ගුණවර්ධන මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලාංකිකයන් විශාල ප්‍රමාණයක් විදේශ රැකියාවල නියුතුව සිටින අතර සාමාන්‍යයෙන් එක් පුද්ගලයෙකු නැවත අප රට වෙත ප්‍රේෂණය කරන මුදල, පසුගිය දශක දෙක තුනකට පෙර ප්‍රමාණයට වඩා, මේ වනවිට ඉහළ ගොස් ඇති බව දන්නේද;

(ii) මෙලෙස වැඩිම ශ්‍රී ලාංකික රටවිරුවන් සිටින රටවල් දහය සහ නගර දහය මොනවාද;

(iii) මෙලෙස වැඩිම ශ්‍රී ලාංකික ඒක පුද්ගල ප්‍රේෂණය සාමාන්‍ය අගයන් ඇති, රටවල් දහය සහ නගර දහය මොනවාද;

(iv) එලෙසම සමස්ත අගයක් ලෙස, වැඩිම ප්‍රේෂණ සිදුකරන රටවල් දහය සහ නගර දහය මොනවාද;

(v) ඉහත සඳහන් රටවල් හෝ නගරවල සිට මුදල් ප්‍රේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් අනුමත යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක පහසුකම් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2935/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ඉරුදින ප්‍රහාරය වැළැක්වීම සඳහා සුදුසු පියවර නොගැනීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නඩු තීන්දුවක් ලබා දී ඇති දිනය කවරේද;

(ii) එම නඩු තීන්දුව අනුව වැරදිකරුවන් වී ඇති එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය හා තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් පුද්ගලයා සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම අධිකරණ තීන්දුව ක්‍රියාත්මක කිරීම සඳහා මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2970/2023

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලයේ හා හම්බන්තොට ඉදිකර ඇති තෙල් ටැංකි සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් තෙල් ටැංකියේ ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම තෙල් ටැංකිවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3077/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවතින දුම්රිය ස්ථාන හා උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දුම්රිය ස්ථාන නවීකරණය කර මහජනතාවට ප්‍රියමනාප ස්ථාන බවට පත්කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) දුම්රිය සේවයේ සහ සේවකයන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3094/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය ආයතන සඳහා භාණ්ඩ මිලදී ගැනීමේදී අනුගමනය කළ යුතු ප්‍රසම්පාදන ක්‍රමවේද උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් සඳහා අවශ්‍ය අමතර කොටස් පංචිකාවත්තෙන් මිල දී ගෙන තිබෙන බව දන්නේද;

(iii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා නිසි ප්‍රසම්පාදන සැලස්මක් නොමැති බව දන්නේද;

(iv) එසේ නම්, එම මණ්ඩලය සඳහා නිසි ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූලි 21 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3107/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, නෙඩුන්තීවු දූපතේ පිහිටා ඇති සංචාරක ස්ථානවල නම් කවරේද;

(ii) වර්ෂ 2010 සිට 2020 දක්වා නෙඩුන්තීවු දූපතට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සංචාරකයන් ආකර්ශණය කර ගත හැකි ආකාරයෙන් ඉහත සංචාරක ස්ථාන නඩත්තු කරනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් සංචාරක ස්ථාන අතරින් මේ වනවිට ප්‍රතිසංස්කරණය කර ඇති සංචාරක ස්ථානවල නම් කවරේද;

(ii) එම සංචාරක ස්ථාන ප්‍රතිසංස්කරණ කිරීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) මේ වනතෙක් එම සංචාරක ස්ථාන ප්‍රතිසංස්කරණය කර නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) නෙඩුන්තීවු දූපතේ පිහිටා ඇති සංචාරක ස්ථාන විධිමත් ලෙස ආරක්ෂා කිරීමට සහ නඩත්තු කිරීමට අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3172/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 5ක කාලය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පොල්තෙල් ප්‍රමාණය සහ ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ පොල්තෙල් ආනයනය කරන ලද ආනයනකරුවන්ගේ විස්තර කවරේද;

(iii) ශ්‍රී ලංකාවට පොල්තෙල් ආනයනය කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආනයනික පොල්තෙල්වල ගුණාත්මකභාවය පරීක්ෂා කරනු ලබන ආයතනය කවරේද;

(ii) ඉහත සඳහන් කාලය තුළදී අහිතකර පොල්තෙල් ආනයනය කර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් ආනයනකරුගේ නම සහ ආනයනය කරන ලද පොල්තෙල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පොල්තෙල් තොග සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3230/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සිට කොළඹ වරාය වෙත වාර්ෂිකව කන්ටේනර් බහාලුම් විශාල සංඛ්‍යාවක් ප්‍රවාහනය කරනු ලබන බව පිළිගන්නේද;

(ii) එම කන්ටේනර් බහාලුම්, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් කොළඹ වරාය වෙත ප්‍රවාහනය කිරීම සඳහා යෝජනා කර තිබේද;

(iii) එසේ නම්, එම යෝජනා කවරේද;

(iv) මේ වනවිට එම යෝජනා ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ඛනිජ තෙල්, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් විවිධ ප්‍රදේශ වෙත ප්‍රවාහනය කිරීම සඳහා යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම යෝජනා කවරේද;

(iii) මේ වනවිට එම යෝජනා ක්‍රියාත්මක කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3317/2023

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින ගවයන් වර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රදේශවලට ආවේනික ගවයන් සිටින්නේද;

(iii) ශ්‍රී ලංකාවේ සිටින කිරි ගවයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම කිරි ගවයන්ගෙන් දෛනිකව ලබා ගන්නා කිරි ලීටර් සංඛ්‍යාව එක් එක් ගවයන් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මේ වනවිට ගැබ්ගෙන ඇති කිරි ගවයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිරිපිටි ආනයනය කිරීම සඳහා විශාල මුදලක් වැය කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, ශ්‍රී ලංකාවේ කිරි ගවයන් සහ කිරි ගොවීන් ආරක්ෂා කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3318/2023

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්තමානයේ බහුල වශයෙන් රිය අනතුරු සිදු වන බව පිළිගන්නේද;

(ii) කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගයේ, ඉදිගහමුල හන්දිය අසල පසුගිය වසර පහ තුළ සිදුවූ රිය අනතුරු සංඛ්‍යාව සහ එම අනතුරු හේතුවෙන් ජීවිතක්ෂයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැබඩ දෙස සිට කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගයට පිවිසුම් මාර්ගයක් තිබෙන බවත්;

(ii) වැබඩ මාර්ගයේ සිට ප්‍රධාන මාර්ගයට පිවිසෙන වාහන මහනුවර හෝ කොළඹ දෙසට ගමන් කරන බවත්;

(iii) එම ස්ථානයේ ඇති පදිකමාරුවේ රිය අනතුරු විශාල සංඛ්‍යාවක් සිදු වී ඇති බවත්;

(iv) එම පදිකමාරුව සහ පිවිසුම් මාර්ගය එකම ස්ථානයේ පිහිටා තිබීම එයට හේතු වී ඇති බවත්;

(v) වර්ෂ ගණනාවක සිට ඒ සම්බන්ධයෙන් දැනුම්වත් කළද, මේ වනතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් ස්ථානයේ සිදු වන රිය අනතුරු වළක්වා, ජීවිත හා දේපළ හානි අවම කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3321/2023

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ එක් එක් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන සේවක සංඛ්‍යාව සහ අනධ්‍යයන සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත එක් එක් විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ බණ්ඩනය විවිධ කාණ්ඩ අනුව කවරේද;

(iii) එක් එක් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාවේ දැනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) කොළඹ විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පීඨය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත එක් එක් රජයේ විශ්ව විද්‍යාලයේ —

(i) මේ වනවිට පශ්චාත් උපාධි සහ/ හෝ සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටින කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) සේවය හැර ගොස් ඇති කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(iii) 2021 වසරේ සිට 2023 වසර දක්වා සේවයෙන් ඉල්ලා අස් වූ කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(iv) කොන්ත්‍රාත්, බාහිර සහ තාවකාලික යන පදනම් වල සේවයේ යෙදී සිටින අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද ?

3335/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 නොවැම්බර් මාසයෙන් පසු පත්කර ඇති එක් එක් ජනාධිපති කාර්ය සාධක බලකායේ නම, එය පත්කරන ලද දිනය , සහ මේ වනවිට පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව, සාමාජිකයන්ගේ නම්, ඔවුන්ගේ තනතුරු, සුදුසුකම්, ගෙවනු ලබන වැටුප්, දීමනා සහ ලබා දෙන වෙනත් පහසුකම්;

(ii) එම එක් එක් කාර්ය සාධක බලකාය තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන ලද අරමුණු;

(iii) එම අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3337/2023

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර, කුරුවිට, ‘‘පැරඩයිස් වැව’’ පතුලේ රොන්මඩ සහ වැලි ඉවත් කරන බව හඟවමින් යන්ත්‍රෝපකරණ භාවිතා කරමින් අඩි 30ක් පමණ හාරා එහි පවතින මැණික් ඉල්ලම් වෙනත් ප්‍රදේශයකට රැගෙන යාමට පිරිසක් සැලසුම් කර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් වැවේ ඝන රොන් මඩ ස්ථරයට හානි සිදු වී වැවේ ජලය සිඳී යාමේ තර්ජනයක් පවතින බවත්;

(iii) වැව ආශ්‍රිත ළිං 112ක් පමණ සිඳී යාමේ තර්ජනයක් හා ‘‘ලේක් සයිඩ්’’ ගම්වාසීන්ගේ නිවෙස් ඉරිතලා ගිලා බැසීමේ අවදානමක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ආකාරයට වැව හෑරීම සඳහා අදාළ වගකිව යුතු රාජ්‍ය ආයතනවලින් විධිමත් අවසරයක් ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, හෑරීම සඳහා අවසර ලබා දී ඇති ගැඹුර කොපමණද;

(iii) ඉහත (අ)(i)හි සඳහන් කාර්යය හේතුවෙන් සිදු වන පරිසර හානිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3350/2023

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රිජ්වේ ආර්යා ළමා රෝහලේ මේ වනවිට සේවය කරනු ලබන ප්‍රධාන සුළු සේවා පාලකවරයා වර්ෂ 16කට අධික කාලයක් එම රෝහලේ සේවය කරමින් සිටින බවත්;

(ii) ඔහු විසින් සිදු කරනු ලබන විවිධ අක්‍රමිකතා සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පැමිණිලි විශාල සංඛ්‍යාවක් ලැබී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පැමිණිලි සම්බන්ධ පරීක්ෂණ අතරමග නතර කිරීමට හේතු කවරේද;

(ii) ඉහත සේවකයා සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතු කවරේද;

(iii) ඔහු විසින් සිදු කරනු ලබන විෂමාචාර සහ අක්‍රමිකතා නැවැත්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3353/2023

ගරු ජයන්ත සමරවීර මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට හඳුනාගෙන ඇති පුරාවිද්‍යා ස්මාරක සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පුරවිද්‍යා ස්මාරකයේ නම, පිහිටා ඇති පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2023.06.01 දින වනවිට ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇති පුරාවිද්‍යා ස්මාරක සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් පුරාවිද්‍යා ස්මාරකයේ නම, පිහිටා ඇති පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(iii)හි සඳහන් පුරාවිද්‍යා ස්මාරක අතරින් මේ වනවිට කැනීම් හා සංරක්ෂණ කටයුතු සිදු කරනු ලබන පුරාවිද්‍යා ස්මාරක සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පුරාවිද්‍යා ස්මාරකයේ නම, පිහිටා ඇති පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇති එහෙත් මේ වනතෙක් සංරක්ෂණ කටයුතු සිදු කර නොමැති පුරාවිද්‍යා ස්මාරක සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් පුරාවිද්‍යා ස්මාරකයේ නම, පිහිටා ඇති පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?